# පුලතිසි පුරවරයේ පැරණි සන්නිවේදනය සහ පොත්ගුල් සම්ප්‍රදාය

## Ancient Communication and Pothgull Tradition in the Pulathisi City of Sri Lanka

ඒ.එස්. සිරිවර්ධන


## Abstract

The era of Polonnaruwa can be pointed out as an important chapter in the Sri Lankan Historical Education tradition which has a strong relationship with Buddhism and public administration. "Ashta Mulayatana" centered around Mahavihara, Abhayagiriya, and Jethavanarama, which started during the Anuradhapura era, continued in Polonnaru, and the tradition of 'Pothgulls' in these has taken a prominent place in the local Education system. This study is done on the contribution of the ancient Literary tradition of Polonnaruwa to ancient communication and Literary sources. The Polonnaruwa period of Literature is important to the evolution of the influence of Sanskrit and Tamil, due to the influence of South India and Sanskrit's impact on the Language of this Country. The works written by great scholars like Gurulugomi have embellished the Hela Literary generation. The Literary innovation that occurred with the Literary Sanskrit Language of the Polonnaru period also received great support from the book tradition. It is accepted by scholars that there was such a book in "Pothgull Vihara" near the Parakrama Samudra. This "Grantha Viharaya" was designed to protect the works written on palm Leaves from natural hazards and conditions of use so that readers could

easily access the reading documents. Furthermore, there are various disagreements about the identity of this building as a building belonging to the Gedige tradition. The development of Education, ancient Libraries, and the awakening of Literary communication in the Kingdom of Polonnaru can be accurately recognized.

**Keywords:** Polonnaru period, Pothgull, Ancient communication, education, Literature

**සාරසංක්ෂේපය**

බෞද්ධ දර්ශනය සහ රාජ්‍ය පරිපාලනය සමග අත්‍යන්ත සබඳතාවයකින් යුතු ශ්‍රී ලාංකේය ඓතිහාසික අධ්‍යාපන සම්ප්‍රදායේ වැදගත් පරිච්ඡේදයක් වශයෙන් පොළොන්නරු රාජ්‍ය අවධිය පෙන්වාදිය හැකි වේ. අනුරාධපුර අවධියේ ආරම්භ වූ මහාවිහාරය, අභයගිරිය සහ ජේතවනාරාමය කේන්ද්‍ර කරගත් අෂ්ට මූලායතන පොළොන්නරුවේ ද අඛණ්ඩව පැවති අතර මේවායෙහි ක්‍රියාත්මක වූ ‘පොත්ගුල්’ දේශීය අධ්‍යාපනයේ ප්‍රමුඛ සේවාවක් ඉටුකර ඇත. පොළොන්නරුවෙහි පැවති එකී පොත්ගුල් සම්ප්‍රදායේ ස්වභාවය සහ ඒවායෙහි සේවාවන් මෙන්ම එයින් පැරණි සන්නිවේදනයට හිමි වූ දායකත්වය පිළිබඳ සිදුකරනු ලබන මෙම අධ්‍යයනයේ දී මහාවංශය, අමාවතුර, මුවදෙව්දාවත ආදී වූ සාහිත්‍ය මූලාශ්‍රයන් ද, සමකාලීනව ලියවුණු සෙල්ලිපි මූලාශ්‍රයන් ද පරිශීලනය කරන අතර පොළොන්නරු රාජධානි අවධියට අයත් පුරාවිද්‍යා ක්ෂේත්‍රයන් ගවේෂණය ද සිදු කෙරෙයි. පොළොන්නරුවේ රාජත්වයට පත් පළමුවැනි විජයබාහු රජු, පළමුවැනි පරාක්‍රමබාහු රජු සහ කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු යන පාලකයන් විසින් සෙසු පාලකයන්ට සාපේක්ෂව බෞද්ධ සංඝාරාම වෙත අනුග්‍රහය දක්වමින් ඒවායේ පැවති පිරිවෙන් අධ්‍යාපනය ඉහළ නැංවීමට උත්සහ කර තිබේ. විශේෂයෙන්ම පොළොන්නරුවේ ‘ජේතවනාරාමය’ යන නමින් විහාර සංකීර්ණයක් ඉදිකරන පළමුවැනි පරාක්‍රමබාහු රජු එය භික්ෂු අධ්‍යාපන මධ්‍යස්ථානයක් වශයෙන් සංවර්ධනය කර තිබේ. සංස්කෘත භාෂාවේ සහ දමිළ භාෂාවේ ආභාසය සහිතව සිංහල

භාෂාව විකාශනය වීමෙහිලා පොළොන්නරු අවධිය වැදගත් වේ. දක්ඛිණ භාරතීය බලපෑම මත සංස්කෘතය මෙරට භාෂාවට බලපෑම් කිරීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් ගුරුළුගෝමී වැනි විශිෂ්ට පඬිවරුන් විසින් රචිත කෘති හෙළ සාහිත්‍ය වංශය අලංකාරවත් කර තිබේ. පොළොන්නරු අවධියේ දී සාහිත්‍යමය සංස්කෘත භාෂාවත් සමග ඇති වූ සාහිත්‍යමය නවෝදයට එකල පැවති පොත්ගුල් සම්ප්‍රදායෙන් ද විශාල පිටිවහලක් හිමි විය. වර්තමානයේ පවා ශේෂව පවතින පරාක්‍රම සමුද්‍රය ආසන්නයේ ඇති පොත්ගුල් විහාරය මෙවන් පොත්ගුලකින් යුක්ත වූවක් බව විද්වතුන්ගේ පිළිගැනීමයි. තල් පත්වල රචිත කෘති ස්වභාවික උවදුරුවලින් සහ භාවිතයේ දී ඇතිවන තත්ත්වයන්ගෙන් මනාව ආරක්ෂාකර ගැන්මටත්, පාඨකයන්ට පහසුවෙන් පොත්පත් පරිශීලනය කළහැකි ආකාරයටත් මෙම පොත්ගුල් විහාරය නිර්මාණය කර තිබේ. ගෙඩිගේ සම්ප්‍රදායේ ගොඩනැගිල්ලක් ලෙස නිර්මිත මෙහි අනන්‍යතාවය පිළිබඳ විවිධ මතගැටුම් පවතින අතර මෙම අධ්‍යයනයේ දී එකී මතගැටුම් කෙරෙහි ද විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ. ඒ අනුව පොළොන්නරු රාජධානි සමයේ පැවති අධ්‍යාපනය වෙත අවධානය යොමු කරමින් ඒවායෙහි පොත්ගුල්, සාහිත්‍යය සහ සන්නිවේදන අනන්‍යතාවන් හඳුනාගත හැකි වේ.

**ප්‍රමුඛ පදඃ** පොළොන්නරු අවධිය, පොත්ගුල්, සන්නිවේදනය, අධ්‍යාපනය, සාහිත්‍යය

## හැඳින්වීම

සන්නිවේදනය වූ කලී Communication යන ඉංග්‍රීසි වචනයෙන් නිපන් 'යම් කිසි අදහසක් ජනයා අතර පොදු බවට පත් කිරීමේ ක්‍රියාවලියක්' ලෙස හඳුනාගත හැකි වේ. මිනිසාට සිය දෛනික අවශ්‍යතාවන් ඉටු කරගැනීම සඳහා අනෙකුන් හා සමගින් භාෂාවකින්, සංකේතයකින් හෝ වෙනත් ආකාරයකින් අදහස් හුවමාරු කරගත යුතු වේ. සන්නිවේදනය තුළින් ඉටු කෙරෙනුයේ එම කාර්යය යි. භාෂණය, ලේඛනය හෝ සංඥා

මාර්ගයෙන් අදහස්, තොරතුරු ඉදිරිපත් කිරීම හෝ හුවමාරු කර ගැනීම ද සන්නිවේදනය ලෙසින් හඳුන්වයි. අන්තර්වර්තීය පුද්ගල සන්නිවේදනය, අන්තර් පුද්ගල සන්නිවේදනය, සමූහ සන්නිවේදනය, මහජන සන්නිවේදනය, ජන සන්නිවේදනය හා අත්‍යාය සන්නිවේදනය යන සන්නිවේදනය වර්ගීකරණය කළ හැකි වේ. පුද්ගලයෙකුගේ පෞර්ෂ සංවර්ධනය, මෘදු කුසලතා සංවර්ධනය වීම, සමාජානුයෝජනය ආදී ගැටලු රාශියකට ද මේ ඔස්සේ පිළිතුරු සපයාගත හැකි වේ.

පරිණාමයේ සංකීර්ණ කඩයිම් පසුකර පැමිණි මානවයා සිය කණ්ඩායමේ අන්‍යයන් සමගින් අදහස් හුවමාරු කරගැන්ම උදෙසා ශාරීරික සංඥා, විවිධ සළකුණු ආදිය භාවිතයෙන් ඔබ්බට ගොස් ශබ්ද භාවිතය ආරම්භ කිරීම සුවිශේෂී සංධිස්ථානයක් වේ. හෝමෝ සේපියන් මානවයා විවිධ ශබ්ද භාවිතයෙන් භාෂාවක් උත්පාදනය කරගත් අතර ඉන් අනතුරුව කලාව, තාක්ෂණය, දේශපාලනය ආදී අංශයන්ගේ සංවර්ධනයක් ලබා ඇත. මෙසේ භාෂාවක් උත්පාදනය කරගැන්ම වූ කලී මානව සන්නිවේදනයේ උච්චතම අවස්ථාවකි. මෙකී භාෂා කථා කිරීම භාෂණය ලෙසින් හඳුන්වයි. වත්මන් ලෝකයෙහි භාෂාවන් 3500ක් පමණ වාර්තා වී ඇති අතර ලේඛනය සහ භාෂණය යන ද්විත්වයෙහිම ක්‍රියාකාරීව පවතින භාෂාවන් 500ක් පමණ වාර්තා වේ. (සිරිවර්ධන:2012:4) රූපසටහන් හෝ චිත්‍රාක්ෂර මගින් භාෂාව ලේඛනගත කරමින් ලේඛනයට පිවිසි මොවුන් පසුකාලීනව තමන්ටම අනන්‍ය වූ අක්ෂර මාලාවක් නිර්මාණය කරගෙන තිබේ. ශ්‍රී ලාංකේය ඉතිහාසය තුළ ක්‍රි.පූ. තෙවැනි සියවසේ දී පටන්ම අක්ෂර භාවිතය පිළිබඳ සාධක හමු වී ඇත. පූර්ව බ්‍රාහ්මී අක්ෂර සටහන් සහිත ලෙන් ලිපි සහ වළං කටු කැබලි තුළින් තහවුරු වන මෙරට අක්ෂර කාලානුරූපීව වර්තමානයේ භාවිත වන සිංහල අක්ෂර මාලාව බවට විකාශනය වී තිබේ. මෙකී සන්නිවේදන ඉතිහාසයේ ඓතිහාසික සන්දර්භය තුළ ක්‍රි.ව.එකොළොස්වැනි ශතවර්ෂයේ පටන් ක්‍රි.ව. දහතුන්වැනි ශතවර්ෂය අතරතුර කාලයේ පොළොන්නරුව කේන්ද්‍රගතව පැවති පොළොන්නරු රාජධානි සමය වැදගත් වේ. ඊට හේතු වන්නේ එතෙක් හෙළ බස සහ පාළි බස භාවිතයේ පැවති මෙරට සාහිත්‍ය

කලාව කෙරෙහි සංස්කෘත සහ දමිළ භාෂාවන්ගේ බලපෑම හිමිවන හෙයිනි. එමෙන්ම අනුරාධපුර අවධියේ පටන්ම දියුණු මට්ටමක පැවති ආරාමික අධ්‍යාපනය පොළොන්නරු අවධියේ දී තවදුරටත් සංවර්ධනය වන හෙයිනි. මෙකී පොළොන්නරු කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලාංකේය අධ්‍යාපනික ක්ෂේත්‍රයෙහි කඩයිම් අධ්‍යයනය කරන මෙම පර්යේෂණය තුළින් විශේෂයෙන්ම විමසා බලනුයේ පොළොන්නරු අවධියේ දී අධ්‍යාපනික මධ්‍යස්ථාන කේන්ද්‍රීයව පැවති පොත්ගුල් හෙවත් පුස්තකාල සම්ප්‍රදාය කෙරෙහි ය.

**ක්‍රමවේදය**

පොළොන්නරු රාජධානි සමය කේන්ද්‍රගත කරමින් සිදුකරනු ලබන මෙම අධ්‍යයනයේ දී මහාවංශය, නිකාය සංග්‍රහය, බුත්සරණ, අමාවතුර ආදී ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රයන් සහ පොළොන්නරු රාජධානි සමයට කාල නිර්ණය වන සෙල්ලිපි සහ පුරාවස්තු අධ්‍යයනයට බඳුන් කරයි. විශේෂයෙන්ම ක්ෂේත්‍ර ගවේෂණයක් ඔස්සේ පොළොන්නරුවේ පොත්ගුල් විහාර පරිශ්‍රය නිරීක්ෂණයට බඳුන් කරන අතර පොළොන්නරුවේ සෙසු පුරාවිද්‍යාත්මක නටබුන් ද අධ්‍යයනය කර ඇත. එමෙන්ම පසුකාලීනව රචනා වූ සාහිත්‍ය මූලාශ්‍රයන් ද, පූර්ව පර්යේෂකයින්ගේ පර්යේෂණයන් ද උපයෝගී කරගනිමින් ඓතිහාසික සංසන්දනාත්මක ක්‍රමවේදය ඔස්සේ විශ්ලේෂණාත්මකව මෙම පර්යේෂණය සිදුකරනු ලබයි.

**සාකච්ඡාව**

අධ්‍යාපනය වූ කලී ඕනෑම සමාජයක, සංස්කෘතියක හෝ රටක සංවර්ධනය හෝ පසුබෑම තීරණය කරන්නා වූ ප්‍රධානතම සාධකය යි. තම පුරවැසියන්ට ළමා අවධියේ පටන්ම නිසි අධ්‍යාපනයක් ලබා දීම ඔස්සේ රාජ්‍යය තුළ තිරසාර සංවර්ධනයක් ඇති කර ගැනීම ලෝකයේ සෑම රටකම පාහේ අරමුණ වී තිබේ. ඒ අනුව ලෝකයට අවශ්‍යව ඇත්තේ බුද්ධිමතුන් ය. කුසලතාවන්ගෙන් සහ හැකියාවන්ගෙන් යුතු පුද්ගලයින් ය. මෙය වර්තමානයේ පමණක් නොව මානව පරිණාමය ආරම්භයේ පටන්ම පැවති අතර අඛණ්ඩව තම පැවැත්ම රඳා පවත්වාග

නු ලැබූයේ එසේ ලෝකයෙහි ජීවත්වීමට අවශ්‍ය බුද්ධියෙන් යුතු වූවන් පමණි. අද පවතින තත්ත්වයට ශ්‍රී ලාංකේයන් පත් වී ඇත්තේ ද එසේ ලෝකය හා ගැටීමේ හැකියාවැති බුද්ධිමත් මනුෂ්‍ය කොට්ඨාසයක පැවැත්ම හේතුවෙනි. විශේෂයෙන්ම ක්‍රි.පූ.තෙවැනි සියවසේ දී සිදුවන මහින්දාගමනයෙන් පසු බුදු දහම හරහා ඇතිවන අධ්‍යාපනික ප්‍රබෝධය ශ්‍රී ලාංකේය ඓතිහාසික විකාශනය කෙරෙහි අත්‍යන්තයෙන්ම බලපෑම් සිදුකර තිබේ.

මහින්දාගමනයෙන් පසු බුදු දහමේ බලපෑමත් සමග ශ්‍රී ලාංකේය සංස්කෘතියේ නව මානයක් විවෘත වන විට අධ්‍යාපනය තුළ ද භික්ෂු ආරාම කේන්ද්‍ර කරගත් ආරාමික අධ්‍යාපනය සංවර්ධනය වී තිබේ. අනුරාධපුරයේ මහාවිහාරය, අභයගිරිය සහ ජේතවනාරාමය රජරට ශිෂ්ටාචාර සමයේ විශ්වවිද්‍යාල මට්ටමේ අධ්‍යාපන ආයතන වූ අතර දේශීය සහ විදේශීය ගිහිපැවිදි සිසුන් රාශියක් මේවායෙහි අධ්‍යාපනය ලබා ඇත. අනුරාධපුර රාජධානිය පොළොන්නරුවට විතැන් වීමෙන් අනතුරුව ද මෙකී ආරාමික අධ්‍යාපන ආයතන ශක්තිමත්ව පැවති අතර එම ආරාම ත්‍රිත්වය තුළින් හටගත් මූලායතන ලංකාවේ විවිධ ප්‍රදේශයන් වෙත ව්‍යාප්ත වෙමින් ආයතන පිහිටුවාගෙන තිබේ. උත්තර මූල, වහදු මූල, කපාරාමූල සහ මහනෙත් පාමුල යන මූලායතන සතරකින් යුතු අභයගිරිය ජාත්‍යන්තර වශයෙන් චිරප්‍රසිද්ධ විශ්වවිද්‍යාලයක් ව පැවතී ඇත. ගලතුරුමූළ හෙවත් සේලන්තර මූලයත්, විල්ගම්මුල හෙවත් සරෝගාම මූලයත් (රණසිංහ, 2007.223) මහාවිහාරයට අනුබද්ධ අධ්‍යාපනික ආයතන වූ අතර ඒවායෙහි වඩාත්ම අවධානය යොමුකර ඇත්තේ ථෙරවාදී සංකල්පයන් උගැන්ම කෙරෙහි වේ. දක්ඛිණ මූලය සහ සේනාපති මූලය ජේතවන විහාරයට සම්බන්ධ මූලායතන ද්විත්වය විය. (මහින්ද හිමි,2018:93) දක්ඛිණ මූලය වූ කලී සාගලීය හෙවත් වෛතුල්‍යවාදී මහායාන නිකායේ අනුරාධපුර අධ්‍යාපන මධ්‍යස්ථානයයි. මෙලෙසින් උත්තර මූල, මහනෙත්පාමුල, කපාරාමූල, දක්ඛිණ මූල, වහදු මූල, සේලන්තර මූල, විල්ගම්මුල සහ සේනාපති මූල යන මූලායතන අටකින් සැදුම්ලත් මෙරට ප්‍රධාන පිරිවෙන් ආයතන තුළ සිංහල, පාලි, සංස්කෘත ආදී භාෂාවන් ද, වෛද්‍ය ශාස්ත්‍රය, නීතිය,

නක්ෂත්‍රය, ශිල්ප කලා සහ තාරකා විද්‍යාව ආදී විවිධ විෂයන් ද උගන්වා තිබේ. මෙහෙයින්ම විෂයානුබද්ධ ග්‍රන්ථ මෙන්ම බෞද්ධ සාහිත්‍යයේ ප්‍රබෝධයක් ද මෙකල හඳුනාගත හැකි විය.

පොළොන්නරු යුගය තුළ ද පෙර දැක්වූ අෂ්ට මූලායතන නොනැසී පැවතුණු අතර ඇතැම් ඒවායෙහි ප්‍රධාන මධ්‍යස්ථාන පමණක් අනුරාධපුරයෙන් වෙනත් ප්‍රදේශයන් වෙත ගෙනගොස් තිබේ. ප්‍රථයෙන්ම පොළොන්නරුව රාජ්‍ය මාධ්‍යස්ථානය කොට රාජත්වයට පත්වන පළමුවන විජයබාහු රජු (ක්‍රි.ව.1055-1110) විසින් විවිධ වෙහෙර විහාර ඉදි කරමින් කවියන් ඇතුළු උගතුන් සඳහා ප්‍රවේණි ගම් ආදිය ලබා දෙමින් අධ්‍යාපනය කෙරෙහි දායකත්වය දැක්වූ බව මහාවංශය විස්තර කරයි. (මහාවංශයඃ75-76ඃ60ඃ265) දළඳ වහන්සේගේ භාරකාරත්වය පිළිබඳ පළමුවැනි විජයබාහු රජු විසින් වගකීම් පවරා ඇත්තේ ද පෙර පටන් පැවති උත්තර මූලයට වන අතර ඒ වනවිට එහි විහාරාධිකාරී වූයේ මොග්ගල්ලාන නම් භික්ෂූන් වහන්සේ ය. සමකාලීනව රෝහණයේ ප්‍රධානතම අධ්‍යාපන මධ්‍යස්ථානය වූයේ සේලන්තර මූලයයි. පළමුවැනි විජයබාහු රජුගේ බිසවක විසින් සේලන්තර මූලය උදෙසා ප්‍රාසාදයක් කරවා ඇති අතර එතුමන්ගේ දියණියක වූ යශෝධරා කුමරිය විසින් කපාරා මූලයට පිරිවෙණක් කරවී ය. (මහාවංශයඃ 84-85ඃ60ඃ265) විජයබාහු රජුගේ අභාවයෙන් අනතුරුව පළමුවැනි වික්‍රමබාහු රජු (ක්‍රි.ව.1110-1131) ශාසන විරෝධී ක්‍රියාවන්හී නිරත වීම හේතුවෙන් පෙර දැක්වූ මොග්ගල්ලාන හිමියන් විසින් දළදාවේ භාරකාරත්වය ඉන්දියානු හින්දු හමුදා බල ඇණියක් වූ වේලයික්කාර හමුදාව වෙත භාර දී තිබේ. (EZ.Vol.II.p.242-255) විශේෂයෙන්ම පළමුවැනි වික්‍රමබාහු රජුගේ නොමනා ක්‍රියාවන් හමුවේ පෙර සාකච්ඡා කළ මූලායතන අටෙහි භික්ෂූන්වහන්සේලා විසින් දළදාව සහ පාත්‍රා ධාතුව රැගෙන පලා ගිය බව මහාවංශය සඳහන් කරයි. (මහාවංශය.59-60ඃ61ඃ269)

ඉන් අනතුරුව පොළොන්නරුවේ අධ්‍යාපනය කෙරෙහි තීරණාත්මක මෙහෙවර ඉටුකරන ලද්දේ පළමුවැනි පරාක්‍රමබාහු රජු (ක්‍රි.ව.1153-1186) විසින් ය. හෙතෙම ත්‍රිපිටකධර නායක

භික්ෂූන් ඒකරාශී කරවා මහාවිහාර, අභයගිරි සහ ජේතවන විහාර මුල්කොටගනිමින් නිකායන් තුනකට බෙදී ගොස් සිටි ශ්‍රී ලාංකේය භික්ෂු පරපුර සමගි කරවීය. ඒ සඳහා පෙර සාකච්ඡා කළ අෂ්ට මූලායතන හිමිවරුන් ද සහභාගී වී තිබේ. එමෙන්ම එතුමන් විසින් කරවූ ජේතවනාරාමයෙහි අෂ්ට මූලායතන සඳහා වෙන් වෙන් වශයෙන් ප්‍රාසාද අටක් ද කරවා තිබේ. (පූජාවලිය:783) ඒ අතරින් විල්ගල්මූලයට අයත් වූ ප්‍රාසාදයෙහි වැඩ වාසය කළ මුගලන් නම් භික්ෂුව විසින් පාලි ශබ්ධකෝෂයක් වූ අභිදානප්පදීපිකාව රචනා කර තිබේ.

පළමුවැනි පරාක්‍රමබාහු රජු විසින් පොළොන්නරුවෙහි 'ජේතවන' නමින් නාමකරණය කරන ලද විහාර සංකීර්ණයක් කරවා ඇත. මහල් ගොඩනැගිලි 520කින් යුතු එම ජේතවනාරාමයෙහි නායක භික්ෂූන් සහ සාමණේර ශිෂ්‍යයන් උදෙසා වෙන් වෙන් වූ ආවාසයන් ද, ප්‍රතිමා ගෘහයන් ද, වැසිකිළි කැසිකිළි ආදී සනීපාරක්ෂක පහසුකම් ද සළසා තිබේ. විශේෂයෙන්ම එහි පොත්ගුල් දෙකක් කරවා ඇති බව මහාවංශය අනුව පැහැදිලි වේ. (මහාවංශය: 32-50:78:387-388) මෙහි පැවති පිරිවෙන් සඳහා දෙමහල් ප්‍රාසාද හැත්තෑ පහක් කරවී යැයි මහාවංශය සඳහන් කිරීම තුළින් මෙම ජේතවන විහාරයට අනුබද්ධ පුළුල් අධ්‍යාපන ආයතනයක් පැවති බව තහවුරු වේ. ඒ සඳහා දෙමහල් ශාලාවන් කරවීම තුළින්ම ඒවායෙහි උගැන්මට ගිහි පැවිදි සිසුන් විශාල සංඛ්‍යාවක් සම්බන්ධ වන්නට ඇති බව ද මෙහිලා සඳහන් කළ යුතු ය. එමෙන්ම පළමුවැනි පරාක්‍රමබාහු රජු විසින් යන්ත්‍ර-මන්ත්‍ර කාර්යයන් සඳහා ධාරණී ගෘහයක් ද, ජාතක කථා කියවීමට මණ්ඩල නම් වූ ගෘහයක් ද, පිරිත් සජ්ඣායනා කිරීම උදෙසා පංචසත්තති මන්දිරයක් ද, නැටුම්, සංගීත සහ සාහිත්‍යමය කාර්යයන් සඳහා සරස්වතී පණ්ඩපය ද ආදී වශයෙන් ගොඩනැගිලි ගණනාවක් නිමවූ බව සඳහන් වේ. (කුරුප්පු: 2018:171) මෙම ජේතවන විහාර කර්මාන්තය පිළිබඳ දීර්ඝ වර්ණනයක් මහාවංශකරුවා විසින් දක්වා ඇති අතර මේ පිළිබඳ විචක්ෂණශීලීව අවධානය යොමු කිරීමේ දී පැහැදිලි වන්නේ රාජ්‍ය මූලස්ථානය කේන්ද්‍රීයව උසස් මට්ටමේ අධ්‍යාපන මධ්‍යස්ථානයක් නිර්මාණය වී ඇති

බවයි. අනුරාධපුර අවධියේ ක්‍රියාත්මක වූ සංඝාරාම අධ්‍යාපනයට නොදෙවෙනි මෙම විහාර කර්මාන්තය පොළොන්නරුවේ පැවති වෙළෙඳ සමෘධිය හේතුවෙන් තවදුරටත් සංවර්ධනය වන්නට ඇත.

පොළොන්නරුවේ ජේතවන විහාරයෙහි ප්‍රධානියා වූ ටීකාචාර්ය සාරිපුත්ත මහාස්ථවිරයන් වහන්සේ විසින් සාරත්ථදීපනී, සාරදිමඤ්ජුසා සහ ලීනත්ථප්පකාසී යනුවෙන් ටීකා තුනක් ලියා ඇති අතර පළමුවැනි පරාක්‍රමබාහු රජු විසින් උන්වහන්සේට මහානායක පදවිය පිරිනමා තිබේ. (නවරත්නඃ2009.810) පසුකාලීනව 'සංඝරාජ' නමින් ප්‍රසිද්ධ වූ උන්වහන්සේගේ ශාසනික මෙහෙවර තුළින් සුමංගල, වාචිස්සර, සංඝරක්ඛිත, බුද්ධනාග, මේධංකර ආදී පාළි සාහිත්‍යයෙහි ඉමහත් සේවාවක් ඉටුකළ භික්ෂූන් වහන්සේලා මෙරටට දායාද වී ඇත.

පොළොන්නරු අවධියේ පැවති දිඹුලාගල ආරණ්‍යය ද රාජානුග්‍රහය ලැබූ අධ්‍යාපන මධ්‍යස්ථානයකි. වළගම්බා රාජ්‍ය සමයේදී සිදු වූ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට සහභාගී වූ ථූපාරාම විහාරවාසී කුන්තගත්තතිස්ස නම් භික්ෂූන් වහන්සේ දිඹුලාගලට වැඩම කර එහි ගල්ලෙන්හී ධ්‍යාන සුවයෙන් වැඩ සිටියේ යැයි අස්ගිරි තල්පතෙහි සඳහන් වේ. (නවරත්නඃ2009.809) ඉන්පසුව වළගම්බා රජුගේ මැදිහත්වීම මත මෙම ස්ථානය ආරණ්‍ය සේනාසනයක් වශයෙන් සංවර්ධනය කර ඇත. පොළොන්නරු අවධිය වනවිට එහි වැඩසිටි ත්‍රිපිටක විශාරද දිඹුලාගල මහාකාශ්‍යප ස්වාමීන් වහන්සේ බලාවබෝධන නම් සංස්කෘත ව්‍යාකරණ ග්‍රන්ථයත්, සමන්තපාසාදිකාවත් රචනා කරන ලද අතර පළමුවැනි පරාක්‍රමබාහු රජු විසින් කරවූ සංඝ සංශෝධනයට ද සහභාගී වී තිබේ. (ලක්දිව සෙල්ලිපිඃ 2017:373) මීට අමතරව සුමේධ සහ සාරිපුත්‍ර නම් දක්ෂ භික්ෂූන්වහන්සේලා දෙනමක් දිඹුලාගල ආරණ්‍යයෙහි වැඩ වාසය කළ අතර සාරිපුත්‍ර භික්ෂුව අටුවාකරණයේ අති දක්ෂ සාහිත්‍යකාමියෙක් විය. දිඹුලාගල මාරාවීදිය සෙල්ලිපිය අනුව මෙම ආරණ්‍ය සේනාසනයේ වනවාසී භික්ෂූන් උදෙසා පළමුවැනි පරාක්‍රමබාහු රජුගේ බිසව වූ සුන්දර දේවී විසින් සඳමහ ලෙන සහ හිරු මහ ලෙන නම් ලෙන් ආරාම දෙකක් කරවා පූජා කර තිබේ.

පොළොන්නරුවේ ආළාහන පිරිවෙණ ඉතා මෑත කාලයේ දී පවා පුරාවිද්‍යාඥයන්ගේ දැඩි අවධානය දිනාගත් ඉපැරණි අධ්‍යාපන මධ්‍යස්ථානයකි. පළමුවැනි පරාක්‍රමබාහු රජු විසින් පිහිටුවා ඇති ආළාහන පිරිවෙන් භූමියෙහි ලංකාතිලක ප්‍රතිමාගෘහය, කිරි වෙහෙර, බද්ධසීමා ප්‍රාසාදය සහ රෝහල ආදී අංගයන්ගෙන් යුක්ත වේ. භික්ෂු අධ්‍යාපනයට අවශ්‍ය සියලුම අංගෝපාංගයන්ගෙන් සැදුම්ලත් සමකාලීනව විද්‍යාත්මක විෂයන් අධ්‍යයනයට පැවති විශිෂ්ට මධ්‍යස්ථානයක් වශයෙන් මෙය පවතින්නට ඇති බව පුරාවිද්‍යාඥයන්ගේ සහ ඉතිහාසඥයන්ගේ පිළිගැනීමයි. විශේෂයෙන්ම මෙහි රෝහලෙන් හමු වූ බෙහෙත් ඔරු, ශෛල්‍ය වෛද්‍ය උපකරණ, මංජුසා, ඇඹරුම් ගල් ආදියෙන් ඒ බව මොනවට විදහා දැක්වේ. එපමණක් නොව මෙහි හමුවන විදේශීය මැටිබඳුන් අනුව සමකාලීන ජාත්‍යන්තර සබඳතා පිළිබඳ තොරතුරු අනාවරණය වේ.

පළමුවැනි පරාක්‍රමබාහු රජු විසින් කරවා ඇති චෝළකුලාන්ත පිරිවෙන ද පොළොන්නරු රාජධානි සමයේ පැවති විශිෂ්ට අධ්‍යාපන මධ්‍යස්ථානයන්ගෙන් එකකි. මෙහි ප්‍රධානත්මය දැරූ ටීකාචාර්ය බුද්ධනාග හිමියන් විසින් විනය මංජුසා නම් වූ කංඛාවිතරණ ටීකාව රචනා කරන ලදි. එමෙන්ම සමකාලීනව ප්‍රකටව පැවති මහින්දසේල පිරිවෙන ද රාජානුග්‍රහය ලබමින් සංවර්ධනය වූ අතර එහි වැඩ සිටි ත්‍රිපිටක වාචිස්සර හිමියෝ ද සාහිත්‍ය සේවාවන්හි නිරත වූ භික්ෂුවකි. (නවරත්නඃ 2009.810) මානාවුලු නුවර රම්භා විහාරය රෝහණයේ විශිෂ්ට අධ්‍යාපන මධ්‍යස්ථානයක් වශයෙන් ප්‍රකට වූයේ ද පොළොන්නරු රාජ්‍ය සමයේ දී ය. වත්මනෙහි ශේෂ වී ඇති නටබුන් තුළින් විශාල විහාර සංකීර්ණයක් සේ හඳුනාගත හැකි මෙය කාව්‍ය, පාලි, ව්‍යාකරණ, සංස්කෘත භාෂාවන්හී පරතෙරට ගිය භික්ෂූන් බිහිකළ අධ්‍යාපන ආයතනයකි. මානාවුලු සන්දේශය රචනා කළ මහානාග හිමි සහ පද සාධනය රචනා කළ පියදස්සී හිමි මෙම ආයතනයෙන් බිහි වූ දක්ෂ භික්ෂූන් සේ දැක්විය හැකිය.

පළමුවැනි විජයබාහු රජුගේ පටන්ම විවිධ ගම්වර සහ වස්තුව ලබා දෙමින් කාව්‍යකරණය සහ සාහිත්‍යකරණය පිණිස විද්වතුන් යොමු කිරීමේ සම්ප්‍රදායක් රාජ්‍ය පාලකයන් අනුගමනය කිරීම හේතුවෙන් සාහිත්‍යකරණයේ දියුණුවක් ඇති වූ අතර පැරණි ලේඛනයන්හී ගැටපද විවරණය කරමින් සමකාලීන සමාජයට සුදුසු සේ සංස්කරණය කිරීමට මොවුහු යොමු වී ඇත. පළමුවැනි පරාක්‍රමබාහු රජු මෙන්ම නිශ්ශංකමල්ල රජු විසින් ද මෙසේ සාහිත්‍යකරණයෙහි යෙදුණු විද්වතුන් උදෙසා රැකියාවන් පවා ලබා දී තිබේ. සාමණේර භික්ෂූන් විසින් හෙරණසිඛ, සේඛියා, දසධම්ම සූත්‍රය ආදියත්, කුදුසිඛ සහ පාමොක් ද, අනුමාන සූත්‍රය ද උගත් අතර මොවුහු විනයධර, සූත්‍රධර, විදර්ශනාධූර ආදී ලෙස එකිනෙකාට අනන්‍ය වූ මාර්ගයන්හි ගමන්කර තිබේ. ඊට අමතරව පාළි භාෂාව, සංස්කෘත භාෂාව, ආධ්‍යාත්ම විද්‍යාව, හේතු විද්‍යාව, දර්ශනය, වෛද්‍ය විද්‍යාව, ජ්‍යොතිෂ්‍යය, ශබ්ධ විද්‍යාව ආදී විෂයන් ගණනාවක් භික්ෂූන් විෂයෙහිලා පැවතී ඇත. මීට අමතරව ගිහි ශිෂ්‍යයන් ව්‍යාකරණ, ඡන්දස්, කාව්‍ය රීති, නීතිය, වෛද්‍ය ශාස්ත්‍රය, නක්ෂත්‍රය, වාස්තු විද්‍යාව, ගෘහ නිර්මාණ ශිල්පය, රන්කම් ආදී හස්ත කර්මාන්තයන් ද උගත්හ. (නවරත්නඃ 2009.813) මහාවංශයට අනුව පළමුවැනි පරාක්‍රමබාහු රජු පවා තම කුමාර අවධියෙහි විවිධ භාෂා, විෂ වෙදකම, සමුද්‍රිකා ශාස්ත්‍රය, නාට්‍ය ගීත, වෛද්‍ය ශාස්ත්‍රය, අක්ෂර විද්‍යාව, භූත විද්‍යාව සහ රන්කම් ආදිය යන විෂයන්හී අධ්‍යාපනය ලබා තිබේ. විශේෂයෙන්ම එතුමන් ඉන්දියාවේ අශෝක අධිරාජ්‍යය ගොඩනැංවීමෙහිලා ප්‍රබල දායකත්වයක් දැක්වූ කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රය පරිශීලනය කරමින් එහි රාෂ්ට්‍ර පාලන න්‍යායන් පිළිබඳ මැනවින් අධ්‍යයනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පොළොන්නරුව පරිපාලන අංශයෙන් අතිශයින් සාර්ථකත්වයට පත් වූ බව මෙහිලා පෙන්වා දිය යුතු වේ. (නවරත්නඃ 2009.814) පළමුවැනි විජයබාහු රජුගේ ආරාධනය පරිදි ඉන්දීය පඬිවරුන් කිහිපදෙනෙකු මෙරටට විත් අධ්‍යාපන කාර්යයන්හී නිරත වූ හ. විශේෂයෙන්ම අනුරාධපුර අවධියේ දී පාළි භාෂාව වඩා ඉස්මතු වුව ද පොළොන්නරුවේ දී සංස්කෘත භාෂාව කරලියට පැමිණීම හේතුවෙන් සංස්කෘතය හා සිංහල භාෂාව අතර අන්‍යෝන්‍ය බැඳීමක් ඇති වී තිබේ. පළමුවැනි

පරාක්‍රමබාහු රජු විසින් ඉන්දියාවේ සිට ගෙන්වාගත් නිශ්ශංකමල්ල කුමරුන්ට ශිල්ප ශාස්ත්‍රයන් ඉගැන්වූ බව පොළොන්නරු පුවරු ලිපියෙහි සඳහන්කර තිබේ. (නවරත්නඃ 814)

පළමුවැනි පරාක්‍රමබාහු රජුගෙන් අනතුරුව බලයට පත්වන දෙවැනි විජයබාහු රජු ද හොඳින් අධ්‍යාපනය ලැබූවෙක් වන අතර හෙතෙම පාලි භාෂාවෙන් රචනා කරන ලද සන්දේශයක් බුරුම රජු වෙත යවා තිබේ. (Ez.Vol.I.p.181-182) ලීලාවතී රැජිණ ද යහපත් අධ්‍යාපනයක් ලබා දසරාජ ධර්මයෙහි නියුක්තව රාජ්‍ය පාලනයේ යෙදුණු තැනැත්තියක බව ප්‍රකට වී ඇත. මෙලෙසින් අවධානය යොමු කරන විට පොළොන්නරු අවධියේ දී රාජ්‍ය පාලනයෙහි යෙදුණු පාලකයන් ළමා කාලයේ පටන්ම තම දේශපාලනික ක්‍රියාවන් උදෙසා අත්‍යාවශ්‍ය අංශයක් සේ අධ්‍යාපනික අංශය සංවර්ධනය කරගෙන ඇති බව සනාථ වේ.

මේ අනුව සමකාලීනව බෞද්ධ අධ්‍යාපනය වඩාත් පුළුල්ව පැවති බව හඳුනාගත හැකි වේ. එක් එක් අංශයන් සඳහා විශේෂිත වූ ආයතන පිහිටුවීම තුළ ඒවායෙහි එම විෂයන්හී ප්‍රවීණයින් වාසය කරන්නට ඇති බවත්, එම ආයතනයන්ගෙන් නික්මෙන විද්‍යාර්ථීන් අදාළ විෂයෙහි විශේෂඥයින් වන්නට ඇති බවත් මෙහිදී පෙන්වාදිය හැකිය. සාහිත්‍ය සහ දෘෂ්‍ය කලාවන් උදෙසා සරස්වතී මණ්ඩපය වැනි ස්ථානයන් කරවීම තුළ පාලකයා තුළ කලාව කෙරෙහි පැවති නැඹියාව ප්‍රකට වේ. මෙයින් නොනැවතුණු පරාක්‍රමබාහු රජු පූර්වාරාමය, දක්ෂිණාරාමය, උත්තරාරාමය, කපිලවස්තු, ඉසිපතන, කුසිනාරාමය (මහාවංශයඃ 78:386-391) ආදී වූ ධර්මායතන 260කට අධික සංඛාවක් කරවමින් ඒවාට අනුග්‍රහය දැක්වීම හරහා සමකාලීන භික්ෂු අධ්‍යාපනය ඉහළ මට්ටමකට ළඟා වන්නට ඇත. තම පාලන තන්ත්‍රය පහසු කරගනු වස් අමාත්‍යවරුන් යටතේ අමාත්‍යංශ සංවිධානය කළ පරාක්‍රමබාහු රජු අධ්‍යාපන කාර්යයන් සඳහා වෙනම අමාත්‍යංශයක් (කුරුප්පුඃ 2018:171) පිහිටුවීම තුළින් හෙතෙම අධ්‍යාපනය කෙරෙහි දැක්වූ අනුග්‍රහය වඩා ඉස්මතු වී පෙනෙයි. මෙ අතරම ආරණ්‍යවාසී සහ ග්‍රාමවාසී ලෙසින් නිකායන් ද්විත්වයකට බෙදී යන සමකාලීන සංඝ

සමාජය තුළ ද ග්‍රාමවාසී භික්ෂූහු මෙකී පිරිවෙන් අධ්‍යාපනයේ ආලෝකය ලබමින් ප්‍රබල සමාජ කර්තව්‍යක් ඉටු කළහ. මහා පරාක්‍රමබාහු රජුගේ කාල සීමාවෙන් අනතුරුව පොළොන්නරුව ද වියවුල් බහුල තත්ත්වයකට පත්වීම තුළ දේශපාලනික මතගැටුම් උත්සන්න වූ හෙයින් ආරාමික අධ්‍යාපනය කෙරෙහි පෙර දැක්වූ අවධානය යොමු කිරීමට පාලකයන් අපොහොසත් වී තිබේ. තරමක් හෝ අවධානය යොමුකර ඇත්තේ නිශ්ශංකමල්ල රජු (ක්‍රි.ව.1187-1196) පමණි.

අනුරාධපුර අවධියේ මුල් භාගයේදී හෙළ භාෂාව හෙවත් සිංහල භාෂාව මෙරට භාවිතයේ පැවති බවත් එහෙයින්ම මුල් කාලීන ධර්ම ග්‍රන්ථ හෙළටුවා වශයෙන් සිංහල බසින් රචනා වී පැවති බවත් සිහිකළ යුතුය. ඉන් අනතුරුව බුද්ධඝෝෂ හිමියන්, මහානාම හිමියන් ඇතුළු ක්‍රි.ව. හතරවැනි සියවසේ දී පමණ ජීවත්වූ විද්වතුන් විසින් පාලි භාෂාව භාවිත කර ඇත. කෙසේ වෙතත් දසවැනි සියවස පමණ වනවිට ඉන්දියාවේ සංස්කෘත භාෂාව භාවිතයට පැමිණ තිබුණි. එය ක්‍රමයෙන් ලංකාව කෙරෙහි ද බලපෑම් සිදුකරන ලද්දේ දෙරට අතර පැවති රාජතාන්ත්‍රික සබඳතා පදනම් කරගනිමිනි. ඒ අනුව පොළොන්නරු අවධියෙහි ලේඛනයට නැගුණු පොතපත මෙන්ම සෙල්ලිපි ආදිය ද සංස්කෘත මිශ්‍ර සිංහලයෙන් රචනා වී ඇති අතර නිශ්ශංකමල්ල රාජ්‍යෝදය වනවිට සංස්කෘතයෙන් මිදී යා නොහැකි ලෙස සිංහල භාෂාවට සංස්කෘත අක්ෂර සහ වචන එක් වී තිබුණි. (ඥානාවාස හිමි:2018:71) එමෙන්ම වේලයික්කාර බට හමුදාවන්ගේ සහ වෙළෙඳ ප්‍රජාවගේ ආගමනයත් සමග පොළොන්නරු නගරයේ දමිළ ජනගහනය වර්ධනය වීම හේතුවෙන් 'දමිළ' භාෂාව ද දේශීය සාහිත්‍යයට යම් යම් බලපෑම සිදුකර තිබේ. එනයින් විමසා බලන විට අනුරාධපුර අවධියේ දී ඉහළ ස්ථානයක පැවති හෙළ බස කෙරෙහි පාලි භාෂාවේ සෙවනැල්ල වැටුනාක් මෙන්ම පොළොන්නරු අවධියේ දී ඊට සංස්කෘත සහ දමිළ භාෂාවේ සෙවනැල්ල එක් වී තිබේ. මීට හොඳම උදාහරණය නම් මහානාම හිමි විසින් රචිත මහාවංශය පසුකාලීන රචකයින් විසින් රචනා කරන විට (චූලවංශය) එම පරිච්ඡේදයන්හී ඇති වූ භාෂාත්මක වෙනස්වීමයි.

පොළොන්නරු අවධියේ දී සාහිත්‍ය සම්ප්‍රදාය තුළ ඉහළින්ම හඳුනාගත හැකි රචකයා වන්නේ ගුරුළුගෝමී ය. අමාවතුර, ධර්මප්‍රදීපිකාව වැනි උසස් සාහිත්‍ය ග්‍රන්ථයන් රචනාකළ ගුරුළුගෝමී (වික්‍රමසිංහ: 2010:7) පෙර කී සංස්කෘත භාෂා ආභාසය හොඳින්ම ලබාගත් පුද්ගලයෙකි. ඊට අමතරව බුත්සරණ, දහම්සරණ සහ සඟසරණ රචනා කළ විද්‍යාචක්‍රවර්තී ද මෙහිලා පෙන්වාදිය හැකිය. මීට අමතරව පොළොන්නරු අවධියේ දී වෙසතුරු ගාථා සන්නය, මහාබෝධිවංශ ගැටපදය, ජාතකට්ඨකථා ග්‍රන්ථි පදාර්ථ වර්ණනා, අභිධර්මාර්ථ සංග්‍රහ සන්නය, මේඝදූත සන්නය ආදී වූ ග්‍රන්ථ ගණනාවක් රචනා වී තිබේ. ධර්ම කරුණු සහ මෙරට ඓතිහාසික සංසිද්ධීන් ඇතුළත් ධර්ම ප්‍රදීපිකාව බුදුන් වහන්සේගේ පුරිසදම්මසාරථී ගුණය විස්තර කරන අතර සස ජාතකය පදනම් කරගත් සසදාවත, මඛාදේව ජාතකය පදනම් කරගත් මුවදෙව්දාවත සහ බුද්ධ, ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නයේ ගුණ සමුදාය වර්ණිත බුත්සරණ, දහම්සරණ සහ සඟසරණ මෙහිලා වැදගත් කෘතීන් වේ. (අබේකෝන්: 2005:78-153)

මෙලෙසින් පොළොන්නරු යුගයේ සාහිත්‍යයික දියුණුව සහ අධ්‍යාපනික රටාව අධ්‍යයනය කිරීමේ දී මොවුන්ගේ අධ්‍යාපනික මට්ටම අනුව පුස්තකාල පරිහරණය ද ඉහළ තත්ත්වයක පවතින්නට ඇති බව පැහැදිලි වේ. පළමුවැනි පරාක්‍රමබාහු රජු විසින් ජේතවනාරාමයට අනුබද්ධව පොත්ගුල් දෙකක් (මහාවංශය: 2007.32-50:78:387-388) කරවූ බව දැක්වීම තුළින්ම එය තහවුරු වේ. වළගම්බා රාජ්‍ය සමයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමත් අටුවාචාරීන් විසින් ධර්ම කරුණු ඇතුළත් අටුවා රචනයත් ඔස්සේ ඇරඹි ග්‍රන්ථකරණය අභයගිරිය, මහාවිහාරය සහ ජේතවන ආයතන ඔස්සේ තවදුරටත් වැඩී වර්ධනය විය. මෙකී රටාව පොළොන්නරු යුගයේ දී ද නොනැසී පැවතිණි. තල් පත් මත පන්හිඳෙන් ග්‍රන්ථකරණයේ යෙදුන විද්වතුන් විසින් රචිත ග්‍රන්ථ කිහිපයක්ම පෙර සඳහන් කරන ලදි. මෙම අධ්‍යාපනික කෘති බොහෝමයක් බුද්ධිමතුන් සඳහාම නොව සමස්ත සමාජයටම ගැළපෙන පරිද්දෙන් රචනා වූ ග්‍රන්ථ

වේ. ඉන් ජනතාවගේ වින්දන කුසලතා ශක්තිය, සාහිත්‍ය පිළිබඳව පවත්නා කැමැත්ත හා අධ්‍යාපනයේ දියුණු ලක්ෂණ හඳුනාගත හැකි වේ.

මෙකී අධ්‍යාපනයේ දියුණුවත් සමග පොත් පත් පරිශීලනය කෙරෙහි ජනතාව යොමු වීම හේතුවෙන් පොත්පත්වල පිටපත් සඳහා පැවති ඉල්ලුම ඉහළ යන්නට ඇත. පුරාතන ශ්‍රී ලාංකේයන්ගේ පොත් පත් නිර්මාණය වී ඇත්තේ 'පුස්කොළපොත්' වශයෙනි. තල් ගසේ පත්‍රවලින් ඉරා ගන්නා තීරු තැම්බීමෙන් සහ වියළීමේ ක්‍රියාවලියකට භාජනය කර ගින්නෙන් වට පුළුස්සා කෘමීන්ගෙන් හා වර්ෂාවෙන් හානි සිදු නොවන සේ ආරක්ෂිතව පුස්කොළ පොත් සකසා ඇත. මෙහි ලිවීමට භාවිත කර ඇත්තේ 'පන්හිඳ' නම් වූ උල් කටුවකි. (සිල්වාඃ 2018ඃ217) ඉන්පසු අක්ෂර සටහන් කර ඒ මත 'කළු මැදීම' නම් ක්‍රියාවලියක් ඔස්සේ ගැඩුඹ ලී අඟුරු දුම්මල තෙලින් අනා මිශ්‍ර කරගත් ආලේපයක් අකුරු මතුවන තුරු සියුම්ව ආලේප කර තිබේ. මෙය දිගු කාලීන ක්‍රියාවලියකි. හොඳ තත්ත්වයේ තල් පත් කපා ගැනීමේ සිට, ඒවා පත්‍ර නාරටියෙන් වෙන් කර ගැනීමත්, තම්බමින් සහ වියළමින් පදම් කර ගැනීමත්, එක පරිමාණයකින් කපා පොත බැඳ ගැනීමත් මනා ඉවසීමක් සහිතව කළ යුතු විය. එසේ නොවුවහොත් කෘමින්ගේ සහ දිලීරයන්ගෙන් සිදුවන හානි හේතුවෙන් පොතෙහි කල් පැවැත්ම අඩු වේ. තව ද සකස්කරගත් තල් පත් සඳහා පිට කවරය සේ අලංකාර සිතුවම් හෝ කැටයම් සහිත දැව පතුරු මෙන්ම කැටයමින් අලංකාරිත ඇත්දළ කවර ද යොදා තිබේ. අකුරු ලිවීමෙන් අනතුරුව කලු මැදීම ද දීර්ඝ කාලයක් වැය වන ක්‍රියාවලියකි. එහෙයින්ම එකම පොතෙහි පිටපත් කිහිපයකට වඩා නිශ්පාදනය කිරීම අපහසු වී තිබේ. තත් කාලීනව මෙම පුස්කොලපොත් සඳහා ඉහළ වටිනාකමක් හිමි වූයේ ද එකී දුර්ලභ පිටපත් සංඛ්‍යාව හේතුවෙනි. එහෙයින්ම පවතින පිටපත් ස්වභාවික උපද්‍රවයන්ගෙන් ආරක්ෂා කරගැනීමටත්, පරිශීලකයන් වෙත ලබා දෙන අතරම වගකීමකින් යුතුව කටයුතු කිරීමටත් ආයතන අවශ්‍ය වී ඇත. එකී ආයතන පොත් ගුල් හෙවත් පුස්තකාල වශයෙන් හඳුනාගත හැකි වේ.

ආරාමික පුස්තකාල වශයෙන් නඩත්තු වූ මෙම පොත්ගුල් පරිහරණය උදෙසා විවිධ නීති රීති පනවා තිබුණේ එකල තල්පත් ඉරු මත ලියා පැවති එම පොත්වල පිටපත් සංඛ්‍යාව ඉතා සීමිත වූ බැවින් විය යුතුය. උදාහරණයක් වශයෙන් ඉන්දියාවේ සිට පැමිණි බුද්ධඝෝෂ හිමියන්ට මහාවිහාර පොත්ගුලෙහි පැවති පොත් පරිහරණය කිරීමට අවසරය ලැබී ඇත්තේ උන්වහන්සේගේ දැනුම පරික්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව ය. (සිරිවර්ධනඃ 2012ඃ77) තන්තිරිමලය පොත්ගුල, කළුදිය පොකුණ පොත්ගුල, අනුරාධපුර ඇතුළුනුවර පොත්ගුල සහ පොළොන්නරුවේ පොත්ගුල් විහාරය මෙසේ රජරට ශිෂ්ටාචාර සමයට අයත් පොත්ගුල් වශයෙන් දැනට හඳුනාගෙන තිබේ. සාහිත්‍ය පතපොතෙහි සඳහන්වන අන්දමට සිලාකාල රජු දවස මෙරටට වැඩම කරවූ ධර්මධාතු නම් ග්‍රන්ථයක් ජේතවනයෙහි වෙන්කළ ගෘහයක තැන්පත්කර ඊට පුද පූජා පවත්වා ඇති අතර මහාවිහාරයෙහි පැවති ඵලග්ග පිරිවෙන, ග්‍රන්ථාකර පිරිවෙන, දික්සඳසෙනෙවියා පිරිවෙන ආදී පිරිවෙන් ආශ්‍රිතව ද පොත්ගුල් තිබී ඇත. (සිරිවර්ධනඃ 2012ඃ72-73) මෙසේ පොත්ගුල්හි පරිහරණයට යෙදුණු පුස්කොළ පොත් වියැකී යා නොදී ඒවා පිටපත් කරමින් නඩත්තු කිරීම රජුගේ කාර්යභාරයක්ව පැවති හෙයින් සිව්වැනි මිහිඳු රජුගේ මිහින්තලා පුවරුලිපිවල (IC.V.II:2004:275) තල් ගස් කැපීම පවා තහනම් කර ඇත. එමෙන්ම නිශ්ශංකමල්ල රජුගේ සෙල්ලිපිවල ද මෙසේ පුස්කොළ පොත් පිටපත් කිරීම පිළිබඳව සඳහන් වී තිබේ. (සිරිවර්ධනඃ2012ඃ73)

පොළොන්නරු අවධියේ දී මෙකී ආරාමික පොත්ගුල් සඳහා රාජානුග්‍රහය ලබා දීමට මුලපුරමින් පළමුවැනි විජයබාහු රජු විසින් දඹදිවින් පැමිණි පණ්ඩිත විද්වතුන් සඳහා අවශ්‍ය දෑ සම්පාදනය කර ඇති අතරම ත්‍රිපිටකය පිටපත් කරමින් භික්ෂූන් අතර බෙදාහැර තිබේ. (මහාවංශයඃ 2007.19-22ඃ60ඃ262-263) මෙකී ව්‍යාපාරය තවදුරටත් සංවර්ධනය කළ මහා පරාක්‍රමබාහු රජු විසින් වෙහෙර විහාර ගණනාවක් ගොඩනැංවීමට කටයුතු කර ඇත. මෙකී වෙහෙර විහාර ආශ්‍රිතව පොත්ගුල් 128ක් ගොඩනැංවූ පළමුවැනි පරාක්‍රමබාහු රජු රාජ මාළිගා පරිශ්‍රය තුළ රාජකීය

පොත්ගුලක් ද, ධර්ම ශ්‍රවණය උදෙසා මණ්ඩප ද කරවා තිබේ. (සිරිවර්ධනඃ2012ඃ84)

වර්තමාන පරාක්‍රම සමුද්‍රය ආසන්නයේ ප්‍රසිද්ධව ඇති පොත්ගුල් විහාර සංකීර්ණය සහ පොත්ගුල් විහාර ප්‍රතිමාව සහිත භූමි භාගය විද්වතුන් විසින් පුස්තකාලයක් පැවති ස්ථානයක් වශයෙන් නම්කර ඇත. පොළොන්නරු පුරාවිද්‍යා කෞතුකාගාරය පසුකර කිලෝමීටර දෙකක් පමණ වැව් බැම්ම ඔස්සේ ගමන් කිරීමෙන් මෙම භූමියට ප්‍රවේශ විය හැකි වේ. මෙය එක මත එක පිහිටි වේදිකා ත්‍රිත්වයකින් යුක්ත ගොඩනැගිලි සංකීර්ණයකි. එහි පහළම මළුවේ භික්ෂු ආවාස යැයි අනුමාන කළ හැකි ගොඩනැගිලි පිහිටුවා ඇත. දෙවැනි මළුව සක්මන් කිරීම පිණිස සකස් කරන්නට ඇත. පොත්ගුල යැයි සැළකෙන ගොඩනැගිල්ල ඉහළම මළුවේ පිහිටුවා ඇත. වට අඩි 157ක් වන ගෝලාකාර ගොඩනැගිල්ලක් වන මෙම පොත්ගුල ශිලාමය උළුවස්සකින් යුක්ත වේ. මෙහි පියස්ස ද ගෙඩිගේ සම්ප්‍රදාය අනුව යමින් ගඩොලින්ම කරවා තිබී ඇතත් දැනට පියස්ස ගරා වැටී විනාශ වී ගොසිනි. ගොඩනැගිල්ලේ නැගෙනහිර පාර්ශ්වයේ අන්තරාලයක සළකුණු ඇති අතර බිත්තවල ඇතුළු පැත්තේ ඇති ඉපැරණි බදාම තට්ටු මත සිතුවම් ඇඳ තිබූ බව හඳුනාගත හැකිය. පිටත බිත්ති ද පේකඩ සහ විමාන මගින් අලංකාර කර ඇත.

වර්ෂ 1885-1886 කාලයේ දී බ්‍රිතාන්‍ය ජාතික බරෝස් විසින් මෙහි කැණීම් සිදුකර ඇති අතර වර්ෂ 1888 දී එවකට සිටි දියවඩන නිලමේවරයා විසින් පුස්කොලපොත් සොයා මෙහි කැණීම් සිදුකර ඇත. කෙසේ වෙතත් ඒ වනවිටත් නිධන් හොරුන්ගේ ග්‍රහණයට ලක් වී තිබූ මෙයින් එවන් ලියවිල්ලක් හමු වූ බවට සාධක නොමැත. (සෝමතිලකඃ 20) පසුකාලීනව වර්ෂ 1904 දී නැවතත් මෙම ගොඩනැගිලි සංකීර්ණය එළිපෙහෙළිකර තිබේ. වර්ෂ 1906 දී එච්.සී.පී.බෙල් මෙහි කැණීම් විධිමත්ව ආරම්භ කළ අතර ඒ වනවිටත් මෙම ගොඩනැගිල්ලට නාමකරණයක් ලබා දී නොතිබුණි. නමුත් උඩරට වාසියෙකු විසින් මෙය පොත් ගුලක් යැයි හැඳින්වීමත්, පෙර කැණීම් වලදී මෙයින් පුස්කොල පොත් සෙවීමත් හේතු පදනම් කොටගෙන

බෙල් විසින් ද මෙය පොත්ගුල් විහාරය ලෙසින් හඳුන්වා ඇත. (සෝමතිලකඃ 19) කෙසේ වෙතත් බෙල් අනුමාන කරන්නේ මෙය පරාක්‍රමබාහු රජු විසින් ජාතක කතා ශ්‍රවණය කිරීම පිණිස නිමවූ මණ්ඩල මන්දිරය විය හැකි බවයි. ඇතැමෙකු පවසන්නේ මෙය ජේතවනයේ පැවති ධම්මසංසණී ගෘහයට සමාන ධර්ම පුස්තකයන්ට වැඳුම් පිදුම් කිරීම පිණිස නිමවූ ගොඩනැගිල්ලක් බවයි. සේනක බණ්ඩාරනායක මෙය චෛතියඝරයක් වශයෙන් ද, එච්.ටී.බස්නායක මෙය ප්‍රතිමාඝරයක් ද ලෙස දක්වන අතර රාජා ද සිල්වා දක්වන්නේ මෙය මියැන්මාරයේ ඇති මීබෞමේ විහාරයට සමාන බෞද්ධ ආරාමයක් බවයි. බොහෝ විද්වතුන් මේ ඉදිරිපිට ඇති මහා පරාක්‍රමබාහු රජුගේ පිළිරුව යැයි සැළකෙන පිළිමය හා සම්බන්ධ කර මත ගොඩනගා ඇත. මෙම ප්‍රතිමාව අතැතිව ඇත්තේ පුස්කොළ පොතක් බව සමහරෙකුගේ මතය වන අතර පරණවිතාන විසින් පෙන්වා දෙනුයේ මෙය රාජත්වයේ සංකේතය වූ වියගස බවයි. මෙය රජෙකුගේ හෝ බෞද්ධ යතිවරයෙකුගේ රුවක් නොව ප්‍රසිද්ධ ගුරුවරයෙකුගේ ප්‍රතිමාවක් විය හැකි බව එච්.සි.පී. බෙල් පෙන්වා දී ඇත. පරණවිතානයන් විසින් මුලදී මෙය තාපසයෙකු හෝ ඍෂිවරයෙකුගේ ප්‍රතිමාවක් බව දැක්වූව ද පසුකාලීනව මෙය පරාක්‍රමබාහු රජුගේ ප්‍රතිමාව ලෙසින් හඳුන්වා ඇත. බරොස්ගේ මතය වන්නේ මේ වූ කලී නීති ග්‍රන්ථයක් අතැතිව සිටින මහා පරාක්‍රමබාහු රජු බවයි. මෙයින් දැක්වෙනුයේ පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ ඉන්දියාවේ සිට මෙරටට පැමිණ අධ්‍යාපනය ප්‍රචලිත කළ බ්‍රාහ්මණ පූජකවරයෙකු බව අනුරාධ සෙනෙවිරත්නයන් පෙන්වා දී ඇත. (සමරසිංහ, 2019) පුස්තකයක් දෑතින් දරා ඉදිරිපසින් පෙනෙන පුස්තකාලය දෙස බලා සිටින ප්‍රතිමාවේ කැටයම බුද්ධියේ අග්‍ර ඵලය සකේතාත්මකව ඉදිරිපත් කිරීමට ප්‍රවීණ කලාකරුවෙකු විසින් කළ ප්‍රතිභාපූර්ණ නිර්මාණයක් මිස ඉන් කිසියම් නිශ්චිත පුද්ගලයෙකු නිරූපණය නොකරන බවට ද අදහසක් ඇත. බොහෝ විද්වතුන් මෙය මහා පරාක්‍රමබාහු රජුගේ යැයි විශ්වාස කරමින් පොත්ගුල පිළිබඳ ව ද අධ්‍යයනය කර ඇත. මොහු අතදරා හිඳිනුයේ පුස්කොළ පොතක් බව දක්වමින් තත් කාලීන අධ්‍යාපනය හා බැඳි පුස්තකාලයක් මෙහි පැවති බවට බොහෝ විද්වතුන් පෙන්වා දී ඇත.

කෙසේ වුව මෙහි වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම අධ්‍යයනය කිරීමේ දී මෙය අනුරාධපුර ඇතළු නුවර පොත්ගුලට සමාන වාස්තු විද්‍යා ඉදිකිරීමක් බව හඳුනාගත හැකි වේ. පොළොවෙන් ඉහළට එසවූ මාලකයක් තුළ පොත්ගුල කරවීම තුළින් වර්ෂාවන්ගෙන් සහ වෙනත් ස්වභාවික උවදුරුවලින් පුස්කොලපොත් ආරක්ෂාකර ගැනීමේ අරමුණක් පවතින්නට ඇති බව හෙළිවේ. එමෙන්ම සක්මන් මළුවක් සහ කුටි සහිතව අවට වටපිටාව සකස් කරවීම තුළ ග්‍රන්ථ පරිශීලනයේ යෙදෙන පාඨකයන්ට නිදහසේ තම කාර්යය කරගැන්මට අවස්ථාව සළසා ඇති බව හඳුනාගත හැකිය (සිරිවර්ධනඃ 2012ඃ102) වත්මන් පුස්තකාලයක් මෙන්ම පොත් සුරක්ෂිතව තැන්පත් කිරීම උදෙසා මෙම ගෙඩිගේ සම්ප්‍රදායේ ගොඩනැගිල්ල කරවා ඇති අතර එහි ඇතුළු බිත්ති මටසිළිටි කර ඒ මත සිතුවම් ඇඳීමෙන් හුදු පොත්වලින් පමණක් නොව දෘෂ්‍ය මාධ්‍යයෙන් ද පාඨකයින් පිනවීමට නිර්මාණකරුවන් උත්සහ කර තිබේ. එමෙන්ම ආරක්ෂිතව තැන්පත් කළ පොත් පත් අදාල විහාර සංකීර්ණයෙන් පිටතට ගෙන යාමෙන් වැළකී ඒවා ආරක්ෂිතව අධ්‍යයනය කිරීමටත්, පාඨකයන්ට නේවාසිකව හිඳීමටත් පහළ මළුවෙහි කුටි නිර්මාණය කර තිබේ. පොත්ගුලෙහි ස්ථානගත වීම ද මෙහිලා විශේෂත්වයකි. එනම් කළබලකාරී අගනගරයෙන් තරමක් දුරස්ව, නමුත් ඉතා දුරින් ද නොවන පරිදි පහසුවෙන් ළඟා විය හැකි ස්ථානයක මෙය පිහිටුවා ඇති අතර වැව් දියෙන් සිහිල් වායු ධාරාවන්ගෙන් සැදුම්ලත් නිස්කලංක පරිසරයක මෙය නිර්මාණය කර තිබේ. එයින් පාඨකයාගේ ශාරීරික පහසුව මෙන්ම මානසික සුවතාවය ද අපේක්ෂා කරන්නට ඇත.

### සමාලෝචනය

මෙලෙසින් විමර්ශනය කිරිමේ දී පොළොන්නරු අවධිය වනවිට ශ්‍රී ලාංකේය සන්නිවේදන සම්ප්‍රදාය තුළ භාෂණය සහ ලේඛනය සංවර්ධනාත්මක ලක්ෂණ පිළිබිඹු කර ඇති බව හඳුනාගත හැකි වේ. සිංහල භාෂාවට පාළි, සංස්කෘත සහ දමිළ භාෂාවන්ගේ ආභාසය ලැබීමෙන් ශබ්ධ සහ අර්ථ රසයන්ගේ විවිධ වෙනස්කම් මෙකල සිදු වී ඇත. ශ්‍රී ලාංකේය සන්නිවේදන

සම්ප්‍රදාය තුළ පොළොන්නරු යුගයේහිදී පාලි, සංස්කෘත සහ දෙමළ යන භාෂාවලින් බලපෑමට ලක් වූ සිංහල භාෂාවේ සංකීර්ණ පරිණාමය, කථනය, ශබ්දය සහ අර්ථය යන අංශයන්හි සැලකිය යුතු වෙනස්කම් මෙන්ම ලේඛනයේ සංවර්ධනීය ලක්ෂණයන් ද හඳුනාගත හැකි වේ. කෙසේ වුව පොළොන්නරුවේ පැවති විශේෂයෙන් සමෘද්ධිමත් කාලවලදී පොළොන්නරුවේ පාලකයන් අධ්‍යාපනික ප්‍රගමණයට ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. අධ්‍යාපන ක්ෂේත්‍රය කෙරෙහි ඔවුන්ගේ රාජකීය අනුග්‍රහය, ප්‍රකාශිත දැනුම ව්‍යාප්තිය සඳහා පොත්පත් ලිවීමට සහ අධ්‍යාපන ආයතන පිහිටුවීමට සහාය වීම හා කැපවීම විශේෂයෙන් පෙන්නුම් කරයි. අධ්‍යාපනය සඳහා අවශ්‍ය පිරිවෙන් ගොඩනැගිලි, ශාලා, පුස්තකාල, නේවාසිකාගාර සහ සනීපාරක්ෂක පහසුකම්වලින් සමන්විත පුළුල් යටිතල පහසුකම් සැපයීමට පාලකයන් දක්වන දැඩි උනන්දුව කැපී පෙනෙන අංගයකි. මෙම සාකල්‍ය ප්‍රවේශය ඉගෙනීමට සහ බුද්ධිමය කටයුතු සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට පාලකයන් කැපවී වී ඇත. නගරවැසියන්ට සහ ආරණ්‍යවාසී භික්ෂූන් වහන්සේලාට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා පොළොන්නරුවේ අධ්‍යාපන මධ්‍යස්ථාන පිහිටුවීම තුළින් සමාජයේ විවිධ ජන කොටස්වලට අධ්‍යාපනය ව්‍යාප්ත කිරීමේ පුළුල් මුලපිරීමක් පිළිඹිබු වේ. අධ්‍යාපනය සඳහා වූ කැපවීම, විධිමත් පොත්ගුල් ඉදිකිරීම, විශේෂයෙන්ම තල් පත්‍ර පිළිබඳ ලිඛිත දැනුම සුරැකීමට සහ ආරක්ෂා කිරීමට පාලකයන්ගේ කැපවීම ඉස්මතු කර පෙන්වයි. ඒ අනුව පොළොන්නරුවෙහි ග්‍රාමවාසී සහ ආරණ්‍යවාසී භික්ෂූන් උදෙසා අධ්‍යාපන මධ්‍යස්ථාන ගණනාවක් බිහි වී තිබේ. මේ අතරින් කැපී පෙනෙන පොත්ගුල් වඩා විධිමත් ගෘහ නිර්මාණයන් වශයෙන් ඉදිකර තල් පත්වල රචිත පුස්තකයන්ගේ ආරක්ෂාව සළසා ඇති අතර නිදහස් මනසකින් යුතුව ග්‍රන්ථ පරිශීලනයට අවශ්‍ය වටපිටාව ද මනාව සැළසුම් කර ඇත. අධ්‍යාපනය සඳහා වූ කැපවීම, විධිමත් පොත්ගුල් ඉදිකිරීම, විශේෂයෙන්ම තල් පත්‍ර පිළිබඳ ලිඛිත දැනුම සුරැකීමට සහ ආරක්ෂා කිරීමට පාලකයන්ගේ කැපවීම මෙහිදී ඉස්මතු කර පෙන්වයි. පොළොන්නරුව නගරයේ පැරණි තදාසන්න ප්‍රදේශයේ පොත්ගුල් විහාර සංකීර්ණය ඉදිකිරිම පොතපත

ආරක්ෂා කිරීම සහ කියවීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම ඉතා සූක්ෂ්ම ලෙස සැලසුම් කළ ආදර්ශමත් අවස්ථාවක් ලෙස විමර්ශනය හුදකලා වේ. සාහිත්‍ය කලාව සංරක්ෂණය කිරීම සහ ව්‍යාප්ත කිරීම සඳහා වූ සංකීර්ණ ප්‍රවේශයක් මෙයින් පෙන්නුම් කෙරේ. මේ කරුණු විමර්ශනය කිරීමෙන් පොළොන්නරු යුගය වන විට සාහිත්‍ය කලාව ඉහළ තලයකට ඔසවා තැබීමට හා බුද්ධිමය කටයුතුවල දියුණුවට උසස් පුස්තකාල පද්ධතියක් බිහි වූ බව තහවුරු කළ හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


*මහාවංශය*, (2007). සංස්: හික්කඩුවේ සුමංගල හිමි සහ වෙනත්, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

අබේකෝන්.ජී.එම්.ලොකුබණ්ඩාර, (2005) *අනුරපුර හා පොළොන්නරු සාහිත්‍යය*, කඩුගන්නාව: කර්තෘ ප්‍රකාශන.

අමරවංශ හිමි, කොත්මලේ (2017) *ලක්දිව සෙල්ලිපි*, කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

කුරුප්පු. කේ.එම්.ඩබ්ලියු. (2018) 'සුප්‍රසිද්ධ විද්‍යාපීඨ', *ලංකාවේ අධ්‍යාපනය*, බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

නවරත්න, එන්.එම්.කේ.බී. (2009) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අධ්‍යාපනය එදා සහ අද, *පුලතිසි වංශය*, බත්තරමුල්ල: සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යංශය.

මහින්ද හිමි, උණුවතුරබුබුලේ, (2018) *ලංකා බෞද්ධ සංස්කෘතිය*, කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

ඥානාවාස හිමි. හේනපිටගෙදර, (2018) 'සංස්කෘත සාහිත්‍ය කෘති සම්පාදනය', *ලංකාවේ අධ්‍යාපනය*, බත්තරමුල්ල: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

රණසිංහ, ආර්.එච්.අයි.එස්. (2007) "බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථානයක් වශයෙන් ශ්‍රී ලංකාවේ මූලායතනයන් හී වැදගත්කම -13වැනි සියවස දක්වා", *සාරදා*,: කැළණිය: කැළණිය විශ්වවිද්‍යාලය.

වික්‍රමසිංහ, අංජලී, (2010) පොළොන්නරු සාහිත්‍යය සහ සමකාලීන දෘශ්‍ය කලා', *https://www.researchgate.net*

සිරිවර්ධන. අශෝකා ශ්‍රියානි, (2012) *ශ්‍රී ලංකාවේ පැරණි සන්නිවේදනය හා පොත්ගුල*, අනුරාධපුර:කර්තෘ ප්‍රකාශන.

සෝමතිලක. මහින්ද, *පොළොන්නරුවේ පොත්ගුල් විහාර ප්‍රතිමාව*, කොළඹ: ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

*Inscriptions of Ceylon Volume -V Part-II*. (2004). 2004. G.S. Ranawella, Sri Lanka: Archaeological survey Department.

*Epigraphia Zeylanica, volume I*, 1994. D.M.D.Z.Wickramasinghe, Madras: Asian Educational Services

*https://www.roar.media.com*